## පළමුවන කියැවීම

උත්පත්ති 15:5-12, 17-18

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

**දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇතිකර ගත් ගිවිසුම**

සමිඳුණන් වහන්සේ ද ආබ්‍රම් පිටතට රැගෙන ගොස්, "අහස දෙස බලා, හැකි නම්, ඔය තාරකා ගණන් කරන්න. නුඹේ දරු පරපුර එසේ ම වන්නේ ය"යි වදාළ සේක. ආබ්‍රම් ද සමිඳුණන් වහන්සේ අදහා ගත්තේ ය. ඒ ඇදහිල්ල ඔහුගේ ධර්මිෂ්ඨකම වශයෙන් උන් වහන්සේ පිළිගත් සේක. එවිට සමිඳුණන් වහන්සේ ඔහුට කතා කොට, "මේ රට නුඹට උරුමයක් කර දෙනු පිණිස ඌර් නම් කල්දිවරුන්ගේ නුවරින් නුඹ පිටතට ගෙනා සමිඳුණන් වහන්සේ මම ය"යි වදාළ සේක. එහෙත් ආබ්‍රම්, "මහෝත්තම දෙවි ස්වාමීනි, මට එය උරුම වන්නට යන බව මා දනගන්නේ කෙසේ ද"යි ඇසී ය. උන් වහන්සේ ද ඔහුට පිළිතුරු දෙමින්, "තුන් අවුරුදු වැස්සියක ද තුන් අවුරුදු එළුදෙනෙක ද තුන් අවුරුදු බැටළුවෙකු ද කොබෙයියෙකු හා පරෙවි පැටවෙකු ද මා වෙත ගෙනෙන්නැ"යි වදාළ සේක. ආබ්‍රම් ද මේ සියල්ල උන් වහන්සේ වෙත ගෙන අවුත් ඔවුන් දෙපළු කොට, පළු දෙක එකිනෙකට මූණලා තැබී ය. එහෙත් ඔහු පක්ෂීන් දෙපළු කෙළේ නැතද මේ මළසිරුරු පිට ගිජු ලිහිණියන් පාත් වූ කල ආබ්‍රම් උන් එළවාදැමී ය. තවද, ඉර බැස යන විට ආබ්‍රම් බර නින්දකට වැටිණි. රුදුරු භීතියකින් ඔහු වෙළී ගියේ ය. තවද, ඉර බැස යයි. අඳුර පැමිණෙයි. දෙපළු කරන ලද සතුන් මැදින් යන දුම් නගින උදුනක් ද, දිළිසෙන ගිනි හුළක් ද, පෙනේ. ඒ දවසේ දී සමිඳුණන් වහන්සේ ආබ්‍රම් සමග ගිවිසුමක් පිහිටුවමින්, "මිසරයේ ගංගාවේ සිට යුප්‍රටීස් මහ ගංගාව දක්වා මේ දේශය නුඹේ පෙළපතට මම දෙමි"යි වදාළ සේක."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 27:1, 7-9, 13-14

පිළිතුර: හිමිසඳ මාගේ ආලෝකය හා විමුක්තිය ය.

ගීය: හිමිසඳ මාගේ ආලෝකය හා විමුක්තිය ය. මම කිසිවෙකුට බිය නොවෙමි. හිමිසඳ මාගේ ජීව ශක්තිය ය. මට භීතියක් නැත. හිමි තුමාණෙනි, මා හඬ නගා කියන දෙයට සවන් දුන මැනව. මට කරුණා කොට උත්තර දුන මැනව.

"මා අබිමුවට එන්නැ"යි ඔබ කියන කල, සමිඳුනි, "ඔබ අබිමුවට එන්නෙමි"යි මාගේ සිතින් කීවෙමි. මා කෙරෙන් ඔබේ මුහුණ සඟවා නොගත මැනව. උදහසින් ඔබ මෙහෙකරුවා බැහැර නොකළ මැනව. ඔබ මාගේ සරණය වන සේක.

මාගේ විමුක්තිදායක දෙවියෙනි, මා පහ නොකළ මැනව. මා අත් නොහළ මැනව. "ජීවතුන් අතර සමිඳුන්ගේ යහපත්කම මට දක්නට ලැබේ ය"යි මම විශ්වාස කරමි. සමිඳුන් කෙරේ විශ්වාස තබන්න. ශක්තිමත් වන්න. ධෛර්යවත් වන්න. සමිඳුන් කෙරේ විශ්වාස තබන්න.

## දෙවන කියැවීම

පිලිප්පි 3:17-4:1

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**අපට ඇති දුබල ශරීර තමන් වහන්සේගේ තේජාන්විත ශරීරයට සමාන වන පිණිස වෙනස් කරන සේක.**

සහෝදරවරුනි, ඔබ හැම දෙන ම මා අනුගමනය කිරීමට එකඟ වන්න. අපි ඔබට ආදර්ශයක් වී සිටිමු. ඒ ආදර්ශය අනුව හැසිරෙන්නන් හොඳින් කල්පනාවට ගන්න. මන්ද, මා බොහෝ වර ඔබට කියා ඇති ලෙසත්, දැන් කඳුළු සලමින් කියන ලෙසත්, බොහෝ දෙනෙක් ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියේ සතුරන් මෙන් හැසිරෙති. ඔවුන්ගේ අවසානය විනාශය වේ. ඔවුන්ගේ දෙවියෝ මාංශික තෘෂ්ණාවෝ වෙති. ලජ්ජා විය යුතු දේ ගැන ඔව්හු පාරට්ටු කර ගනිති. ඔවුන්ගේ කල්පනාව මෙලෝ දේ ගැන පමණ ය. එහෙත් අපි ස්වර්ගයේ පුරවැසියෝ වම්හ. අප ගළවන පිණිස ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගයෙන් වඩින තෙක් අපි බලා සිටිමු. සියල්ල තමන්ට වසඟ කර ගැනීමට ඇති ස්වකීය බලය අනුව, දැනට අපට ඇති දුබල ශරීර, තමන් වහන්සේගේ තේජාන්විත ශරීරයට සමාන වන පිණිස, උන් වහන්සේ ඒවා, වෙනස් කරන සේක. එහෙයින් මාගේ ප්‍රේමවන්ත, හිතවත් සහෝදරවරුනි, මාගේ ප්‍රීතියත්, ඔටුන්නත් වන ප්‍රේමවන්තයෙනි, මෙසේ ස්වාමීන් වහන්සේ තුළ ස්ථිර ව සිටින්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ලූක් 9:35

"මේ මාගේ පුත්‍රයාණෝ ය. මොහුට සවන් දෙන්නැ"යි
පියාණන් වහන්සේගේ හඬ වලාකුළින් නික්මිණි.

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 9:28-35

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**යාච්ඤා කරද්දී, ජේසුස් වහන්සේගේ මූණුවර වෙනස් විය.**

අට දිනකට පමණ පසු ජේසුස් වහන්සේ පේදුරු ද ජොහන් ද ජාකොබ් ද කැඳවා ගෙන යාච්ඤා කරන පිණිස කන්දට නැගුණු සේක. යාච්ඤා කරද්දී, උන් වහන්සේගේ මූණුවර වෙනස් විය. උන් වහන්සේගේ වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබළිණි. හදිසියේ මනුෂ්‍යයෝ දෙදෙනෙක් උන් වහන්සේ සමඟ කතා කරමින් උන්හ. ඔව්හු නම්: මෝසෙස් සහ එලියා ය. ඔව්හු තේජශ්‍රීයෙන් යුක්ත ව පෙනී උන් වහන්සේ ජෙරුසලමෙහි දී ඉටු කරන්න යන ජීවිත පූජාව ගැන කතා කරමින් සිටියහ. පේදුරු ද ඔහු සමඟ වූවෝ ද නිදිබර ව උන්හ. එහෙත් ඔව්හු නින්දෙන් අවදි ව, උන් වහන්සේගේ තේජශ්‍රීය ද උන් වහන්සේ සමඟ සිටි මිනිසුන් දෙදෙනා ද දුටහ. තවද, මෝසෙස් සහ එලියා උන් වහන්සේ වෙතින් වෙන් ව යද්දී, පේදුරු තමා කුමක් කියන්නේ ද යි නොදැන, "ස්වාමීනි, මෙහි සිටීම අපට වාසනාවකි. එබැවින් මණ්ඩප තුනක් සාදමු. එකක් ඔබට ය, එකක් මෝසෙස්ට ය. එකක් එලියාට ය"යි කී ය. ඔහු මෙය කියද්දී ම වලාකුළක් නැගී ඔවුන් සිසාරා පැතිරිණි. වලාකුළ ඔවුන් වසාගත් කල ඔව්හු භීතියට පත් වූ හ. එවිට, "මේ මාගේ පුත්‍රයාණෝ ය, මේ මා තෝරාගත් තැනැත්තාණෝ ය. මොහුට සවන් දෙන්නැ"යි වලාකුළෙන් හඬක් නික්මිණි. ඒ හඬ නැගුණු කල ජේසුස් වහන්සේ පමණක් සිටිනු දක්නා ලදී. ඔව්හු නිහඬ ව සියැසින් දුටු කිසිවක් ඒ දවස්වල දී කිසිවෙකුට නොපැවසූ හ.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.